ඇමුණුම 6B

**<u>බස්නාහිර පළාත් රාජ්‍ය සේවයේ නිලධරයන් රාජ්‍ය සේවය යටතේ ජාතික පාසලකට ස්ථාන මාරු වී යාමේ දී ලබා දිය යුතු ලියවිලි</u>**

**<u>පිරික්සුම් ලැයිස්තුව (Check List)</u>**

**<u>(ශ්‍රී ලංකා ගුරු සේවය)</u>**

| අනු අංකය | ලේඛනය | ඇත. (√ ලකුණ යොදන්න ) | වෙනත් කරුණු දැක්වීම (විස්තර අමුණා ඇත.) |
|---|---|---|---|
| 1. | අධ්‍යාපන අමාත්‍යාංශ ලේකම්ගේ අංක ED/2/29/01/01/124 හා 2024.09.06 ලිපිය අනුව අයදුම්පත් 02ක් | | |
| 2. | බස්නාහිර පළාත් කාර්යය පටිපාටික රීති සංග්‍රහයේ 10 පරිශිෂ්ටය | | |
| 3. | විධිමත් පත්වීම් ලිපියේ සහතික කළ පිටපත් 02ක් | | |
| 4. | මුල් පත්වීම ස්ථිර කිරීමේ ලිපියේ සහතික කළ පිටපත් 02ක්<br>(රාජ්‍ය සේවා කොමිෂන් සභා චක්‍රලේඛ අංක 04/2020 (I) අනුව පළාත් රාජ්‍ය සේවයේ අදාල තනතුරෙහි පත්වීම ස්ථිර කර තිබීම අනිවාර්ය වේ.) | | |
| 5. | රාජ්‍ය සේවා කොමිෂන් සභා චක්‍රලේඛ අංක 04/2020(I) අනුව පහත සඳහන් ලියවිලි | | |
| | • නිලධරයා අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගයේ Z අගය මත හෝ උපාධිධරයෙකු නම් දිපවයාප්ත විවෘත තරහ විභාගයක ප්‍රතිඵල මත අධ්‍යාපන අමාත්‍යාංශය මඟින් තෝරාගෙන පළාත් රාජ්‍ය සේවයට ඇතුලත්ව තිබීම සනාථ කෙරෙන ලිපියේ සහතික කළ පිටපත් 02ක් | | |
| | • පළාත් රාජ්‍ය සේවයේ තනතුර දැරීමට අවශ්‍ය සුදුසුකම් සම්පූර්ණ කිරීම සඳහා මූලික පුහුණුව අධ්‍යාපන අමාත්‍යාංශය යටතේ ලබා තිබීම සනාථ කෙරෙන ලිපියේ සහතික කළ පිටපත් 02ක් | | |
| | • ජාතික සේවයේ අනුරූපී සේවා ව්‍යවස්ථාවේ / බඳවා ගැනීමේ පටිපාටියේ විධිවිධානවලට සමාන විධිවිධාන ඇතුලත් පළාත් රාජ්‍ය සේවා ව්‍යවස්ථාවකින් / බඳවා ගැනීමේ පටිපාටියකින් පාලනය වන තනතුරක් දැරීම සනාථ කෙරෙන ලිපියේ සහතික කළ පිටපත් 02ක් | | |
| | • නිලධාරියා කිසියම් හෝ විනය ක්‍රියාමාර්ගයකට යටත්ව නොසිටිය යුතු අතර පළාත් බලධරයන් විසින් නිලධරයාට එරෙහිව විනයානුකූලව කටයුතු කිරීමට අදහස් කර නොතිබීම යන කරුණු සහතික කර ආයතන ප්‍රධානී විසින් නිකුත් කරන වාර්තාවෙහි මුල්පිටපත හා සහතික කළ පිටපතක් | | |
| | • පළාත් රාජ්‍ය සේවයට අදාලව නිලධාරියාට එරෙහිව කිසිදු අධිකරණ ක්‍රියාමාර්ගයක් ආරම්භ කර නොතිබීම සහතික කර ආයතන ප්‍රධානී විසින් නිකුත් කරන වාර්තාවෙහි මුල්පිටපත හා සහතික කළ පිටපතක් | | |
| 6. | ජාතික සේවයේ තනතුර භාරගන්නා විට දිවයිනේ ඕනෑම ප්‍රදේශයක සේවයේ යෙදීමට එකඟවන බවට ඉදිරිපත් කරන දිවුරුම් ප්‍රකාශය මුල් පිටපත හා ඡායා පිටපතක් | | |
| 7. | වෙනත් පළාත් රාජ්‍ය සේවයකින් / රාජ්‍ය සේවයෙන් ස්ථානමාරු මත බස්නාහිර පළාත් රාජ්‍ය සේවයට පැමිණි නිලධරයෙක් නම් බස්නාහිර පළාත් රාජ්‍ය සේවයට අන්තර්ග්‍රහණය කිරීමේ ලිපිය මුල්පිටපත හා සහතික කළ පිටපතක් | | |

| | | | |
|---|---|---|---|
| 8. | නිලධාරියා සම්බන්ධයෙන් වාර්තා වූ එරෙහිව බරපතල මූල්‍ය අක්‍රමිකතා සම්බන්ධව විගණන විමසුම් ඇති / නැති බව සම්බන්ධයෙන් ආයතන ප්‍රධානී සහතිකය මුල්පිටපත හා සහතික කළ පිටපතක් | | |
| 9. | නිලධරයා රජයේ හෝ බස්නාහිර පළාත් සභාව වෙනුවෙන් ඇප මත වෙනත් පාර්ශවයක් වෙතින් ලබා දී ඇති සහන හෝ වරප්‍රසාද හෝ ඉදිරි කාලයට අදාළ වගකීම්වලින් නිදහස් කර ඇති බවට ආයතන ප්‍රධානී විසින් නිකුත් කරන වාර්තාව (බැංකු, ණය දෙන ආයතන වලට නිලධරයා විසින් අත්සන් තබා ඇති ඇප පිළිබද වාර්තාව) මුල්පිටපත හා සහතික කළ පිටපතක් | | |
| 10. | ස්ථාන මාරු අයදුම්කරුගෙන් බස්නාහිර පළාත් සභාවට අයවිය යුතු ණය ශේෂයන් පිළිබද අදාළ ආයතන ප්‍රධානියා විසින් නිකුත් කරන වාර්තාව<br>ස්ථානමාරු අයදුම්කරු (WPC/PSC/R/FO/02 ආකෘතියෙහි අදාළ කොටස සම්පූර්ණ කර ඉදිරිපත් කළ යුතුය.) මුල්පිටපත හා සහතික කළ පිටපතක් | | |
| 11. | ඉගැන්වීම් කාලසටහන පිටපත් 02ක් | | |
| 12. | ජාතික හැදුනුම්පතෙහි සහතික කළ පිටපත් 02ක් | | |